# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2360/81 - 2023 දෙසැම්බර් මස 02 වැනි සෙනසුරාදා - 2023.12.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : PLDS/LND/04/ACQ/79.
*ඔබේ අංකය*: 4/3/9/2015/ඩබ්එස්/172.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවින් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවදුන් කෝරළයේ උඩ පත්තුවේ සුළු කොට්ඨාස අංක 166A උඩතුල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි රත්නපුර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අ.ග.පි. ර 323, කැබලි අංක 01 හි පහත විස්තර දැක්වෙන ඉඩම් කැබලි 01.

**කැබලි අංක 01**

ඉඩමේ නම: කුට්ටාපිටිය වත්ත කිරිදිඇල්ල කොටස; හිමිකම් කියන්නන්: 01. පූජ්‍ය බෙංගමුවේ ධම්මදින්න හිමි - විහාරාධිපති, ශ්‍රී පාද විහාරය සහ ගල්පොත්තාවෙල රජ මහා විහාරය, 02. මහාභාරකාර තැන, මහාභාරකාර දෙපාර්තමේන්තුව, බුලර්ස් පටුමහ, කොළඹ 07; ඉඩම් පරිහරණය: පැල්මඩුල්ල ජල සම්පාදන ක්‍රමයේ යෝජිත ජල පවිත්‍රාගාරය ඉදිකෙරෙමින් පවතී; ප්‍රමාණය: හෙක්ටයාර් 0.4173.

*උතුරට*: පූජ්‍ය බෙංගමුවේ ධම්මදින්න හිමි හිමිකම් කියන කුට්ටාපිටියවත්ත කිරිදිඇල්ල කොටස; *නැගෙනහිරට*: පූජ්‍ය බෙංගමුවේ ධම්මදින්න හිමි හිමිකම් කියන කුට්ටාපිටිය වත්ත කිරිදිඇල්ල කොටස සහ පාර; *දකුණට*: පාර සහ පූජ්‍ය බෙංගමුවේ ධම්මදින්න හිමි හිමිකම් කියන කුට්ටාපිටිය වත්ත කිරිදිඇල්ල කොටස; *බටහිරට*: පූජ්‍ය බෙංගමුවේ ධම්මදින්න හිමි හිමිකම් කියන කුට්ටාපිටිය වත්ත කිරිදිඇල්ල කොටස.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024.02.28 වැනි දින පෙ.ව. 10.00ට පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2024.02.21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණනය කළ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**බී. එස්. ජී. රුවන්සිරි,**
ප්‍රාදේශීය ලේකම්,
පැල්මඩුල්ල.

2023 නොවැම්බර් මස 30 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0025




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**සංශෝධනයයි**

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : MU/MLL/DS/Land/ACQ/10.
*ඉඩම් අමාත්‍යාංශයේ සටහන් අංකය*: LD/05/2004/VET/184.

ඉහත සඳහන් මාතෘකාව යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2338/07 හා 2023.06.26 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* EOG 06 - 0188 යටතේ පළ කරන ලද දැන්වීමකදී සඳහන් කර ඇති දින ඉවත් කර ඒ වෙනුවට වෙනත් දින වෙනස් කිරීම නිසා එම දැන්වීම පහත සඳහන් පරිදි නිවැරදි කළ යුතු බව මෙයින් දන්වා සිටිමි.

| ඉවත් කළ යුතු දින | ඉවත් කළ යුතු දින වෙනුවෙන් විකල්ප දින (වෙනස් කළ දින) |
|---|---|
| 2023 අගෝස්තු 15 වන දින පෙ.ව. 10.00 | 2024 මාර්තු 13 දින පෙ.ව. 10.00 |
| 2023 අගෝස්තු 08 වන දින | 2024 මාර්තු 06 දින |

එම්. උමාමගල්,
ප්‍රාදේශීය ලේකම්,
මුහුදුබඩ පත්තුව.

2023 නොවැම්බර් 29 වැනි දින,
මුහුදුබඩ පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0026

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.